# නැගෙනහිර පළාත් සභා සංවර්ධන සැසිය

## *මඩකලපුව දිස්ත්‍රික් රැස්වීම් වාර්තාව*

ස්ථානය : ශ්‍රවණාගාරය, මඩකලපුව මහනගර සභාව

දිනය : 30.07.2013

සහභාගිවූවන් : නාමලේඛනය මේ සමග අමුණා ඇත.

1. **පිළිගැනීමේ කතාව හා හැඳින්වීම**

පළාත් සංවර්ධන සැසිවාරයේ මඩකලපුව දිස්ත්‍රික් රැස්වීම ආරම්භ කරමින් පිළිගැනීමේ කතාව ඉදිරිපත් කළ නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම්, එම රැස්වීමට සහභාගී වී සිටි ගරු ප්‍රධාන අමාත්‍යතුමන්, පළාත් අමාත්‍යවරුන්, පළාත් සභා මන්ත්‍රීවරුන්, පළාත් පාලන ආයතන සභාපතිවරුන්, ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා නිළධාරීන් පිළිගත් අතර පළාත් සංවර්ධන සැසිවාරයේ දිස්ත්‍රික් රැස්වීම්වල අරමුණු පැහැදිලි කළේය.

එසේම මෙවැනි දිස්ත්‍රික් රැස්වීම් මගින් සංවර්ධන සැලසුම් ක්‍රියාවලියේදී ගරු ප්‍රධාන අමාත්‍යතුමා, පළාත් අමාත්‍යවරු, පළාත් සභා මන්ත්‍රීවරුන්, පළාත් පාලන ආයතන සභාපතිවරුන් වැනි ප්‍රජා නියෝජිතයන් සහ රජයේ නිළධාරීන්ගේ සහභාගිත්වයෙන් අවශ්‍යතාවයන් සලකාබලමින් එකමුතුව කටයුතු කිරීමටත් එමගින් ජනතාවට වැඩි ප්‍රතිලාභ ලබාදෙන ප්‍රයෝජනවත් වැඩසටහන් සැකසීමට, ඒවා ක්‍රියාත්මක කිරීමට හා ඒවා අධීක්ෂණය කර ඇගයීමට ලක්කිරීමට හා ක්‍රියාත්මක කිරීමේ ගැටළු සාකච්ඡා කර විසඳාගැනීමට හැකිවන බවත් පැවසීය.

2. **ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ මූලාසන කතාව**

පළාත් සංවර්ධන සැසිවාරයේ දිස්ත්‍රික් රැස්වීම් පැවැත්වීම පිළිබඳව තම ප්‍රසංශාව පළකළ ප්‍රධාන අමාත්‍යතුමා ජනතා නියෝජිතයන් සමග සාකච්ඡා කොට සිදුකරනු ලබන සංවර්ධන ක්‍රියාකාරකම් මගින් ගැටළු මගහරවාගෙන සාර්ථක ඉලක්ක කරා ළඟාවිය හැකි බව තම මූලාසන කතාවේදී පැහැදිලි කළේය. වසර 30ක් තිස්සේ පසුබෑමට ලක්ව තිබූ මඩකලපුව දිස්ත්‍රික්කය දැනට සංවර්ධනය වෙමින් පවතින දිස්ත්‍රික්කයක් ලෙස සඳහන් කළ අතර සංවර්ධනයට අදාලව සාර්ථක ක්‍රමවේද හඳුනාගනිමින් අදාල ක්‍රියාමාර්ග ගෙන ඇති බව සඳහන් කළේය.

සංවර්ධනය සඳහා විවිධ මුදල් මූලාශ්‍ර මගින් නැගෙනහිර පළාත් සභාවට 2013 වසර සඳහා ලැබුණ රුපියල් මිලියන 7,000 ක මුදලින් රුපියල් මිලියන 2,230 ක මුදලක් මඩකලපුව දිස්ත්‍රික්කයේ අධ්‍යාපන, සෞඛ්‍ය, මාර්ග, ජලසැපයුම්, කෘෂිකර්මය, ධීවර, සංචාරක, කර්මාන්ත හා පළාත් පාලන සේවා යන අංශවලට වියදම්කර ඇත. මේ සඳහා ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, JICA සහ UNICEF යන ආයතනවල මූල්‍ය ආධාරයෙන් සිදුකරන ලද ව්‍යාපෘති විශාල දායකත්වයක් සපයයි. මෙම වැඩකටයුතු වලදී පළාත් අමාත්‍යංශ, දෙපාර්තමේන්තු හා ඒවායේ දිස්ත්‍රික් කාර්යාල යහපත් අරමුණෙන් හා කැපවීමෙන් සේවය කිරීම පිළිබඳව තම ප්‍රශංසාව පළකළ එතුමා විමසුම් හා සාකච්ඡා මගින් වැඩ පමාවකින් තොරව සිදුකරමින් අනෙකුත් කිසිදු පළාතකට නොදෙවෙනි ආකාරයට අප පළාතද නගාසිටුවා නැගෙනහිර පළාත සමෘද්ධිමත් කළ යුතුයයිද පැවසීය.

3. **නැගෙනහිර පළාත් සංවර්ධන වැඩසටහන**

සංවර්ධන සැසියේ සාකච්ඡා සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් ජාතික සංවර්ධන ප්‍රතිපත්තියට අනුකූලව නැගෙනහිර පළාත් ආවේණික අවශ්‍යතා සඳහා සකසනු ලබන පළාත් සංවර්ධන වැඩසටහන පිළිබඳව ඉදිරිපත්කිරීමක් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් සැලසුම් විසින් සිදුකරන ලදී.

ඔහු තම හඳුන්වාදීමේ කතාවේදී, ක්‍රියාත්මක කරනු ලබන වාර්ෂික ව්‍යාපෘති සියල්ලම දැනටමත් ක්‍රමවත්ව සකසා ඇති නැගෙනහිර පළාත් ආයතනික ප්‍රතිඵල රාමුව (Agency Results Framework) පාදක කරගෙන සකසා ක්‍රියාත්මක කරන ලෙස සඳහන් කළ අතර සංවර්ධන මූල්‍ය ප්‍රතිපාදන සුදුසුලෙස දිස්ත්‍රික් අතර බෙදාදෙනු ලබන බැවින් දිස්ත්‍රික් අතර ජාතීන් අතර සහජීවනයට උදව් වන බව සඳහන් කළේය.

සංවර්ධන ක්‍රියාකාරකම් පිළිබඳව ජනතා නියෝජිතයන්ද සහභාගිකරවාගෙන ක්‍රියාත්මක කරනු ලබන පළාත් සංවර්ධන සැසියේදී දිස්ත්‍රික් රැස්වීම්වලදී සිදුකරන කටයුතු පිළිබඳව ප්‍රශංසා කළ පළාත් සභා මන්ත්‍රීවරු සහ ඒරාවූර් මහනගර සභාවේ නගරාධිපති මෙම කටයුත්ත සාර්ථක කරගැනීම සඳහා පූර්ණ සහයෝගය ලබාදෙන බව පැවසූහ.

4. **සංවර්ධන අංශ පිළිබඳ සාකච්ඡාව**

සාකච්ඡාවට පහසුවන පරිදි පළාත් අමාත්‍යංශ පිළිවෙළින් අංශ ගොනුගත කොට එක් එක් විෂය ආරම්භයේදී අදාල අමාත්‍යංශ ලේකම්වරයා විසින් එහි සංවර්ධන කටයුතු, ක්‍රියාත්මක වෙමින් පවතින හා අනාගත සංවර්ධන කටයුතු හා ආයෝජන වල සාරාංශ ප්‍රකාශයක් සිදුකොට සාකච්ඡාවට ඉඩලබාදෙන ලදී.

ඉන්පසු එක් එක් මාතෘකාව සාකච්ඡාවට ලක්කරන ලද අතර සැසිවාරයට සහභාගීවූවන් විසින් පහත සඳහන් කරුණු ඉදිරිපත් කරන ලදී.

- පළාත් මූල්‍ය සහ විශේෂ ව්‍යාපෘතිවල සහයෝගයෙන් ඉදිකරනු ලබන විශාල මාර්ග ව්‍යාපෘති ඉතා කෙටි කාලයකින් අබලන්ව යන බැවින් තත්වය උසස්කිරීම හා නඩත්තු කටයුතු සඳහා මාර්ග තෝරාගැනීමේදී සාර්ථක ක්‍රමවේදයක් භාවිත කළයුතු බව ප්‍රකාශකළ ජනතා නියෝජිතයන් එහිදී ප්‍රාදේශීය සභාවේ අදහස ලබාගන්නා ලෙස ඉල්ලා සිටියහ.

- පදික වේදිකා වෙළඳුන් හා ස්ථිර වෙළඳසැල් හිමියන් අතර තරගයක් හා ගැටුම් ඇතිවන බව පෙන්වාදුන් පළාත් සභා සභිකයින් පදික වෙළඳුන් පාලනයකිරීමේ අතුරු ව්‍යවස්ථා පළාත් පාලන ආයතන සතුව නොමැති බව එයට හේතුව බවත් එයට සුදුසු උපක්‍රම හඳුනාගෙන ක්‍රියාත්මක කළයුතු බවත් එමගින් පළාත් පාලන ආයතනවල ආදායම වැඩිකළහැකි බවත් ප්‍රකාශකළහ.

- දැයට කිරුළ හා පුරනැගුම ආදී විශේෂ වැඩසටහන් පිළිබඳව සඳහන්කොට මෙවැනි වැඩසටහන් සඳහා ගැලපෙන දෙමළ වචනද භාවිත කළයුතුබවත් එමගින් දෙමළ ජනතාවටත් ඒවායේ පැහැදිලි අර්ථය තේරුම්ගතහැකිවන බවත් ප්‍රකාශකරන ලදී.

- වැව් අලංකරණය ආදී සංචාරක ක්ෂේත්‍රය සම්බන්ධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ස්වාභාවික පරිසරය රැකගතයුතුබව හා අවට පරිසරය පිළිබඳව ක්ෂේත්‍ර අධ්‍යයන සිදුකොට මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් ස්වාභාවික විපත් මගහරවා ගත හැකි බවත් තවදුරටත් මෙවැනි සංවර්ධන වැඩකටයුතු සිදුකිරීමේදී සංස්කෘතික බලපෑමක් සිදුනොවන පරිදි සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙස ද ප්‍රකාශ කරන ලදී.

- ග්‍රාම සංවර්ධන වැඩසටහන්වලට ගම්මාන තෝරාගැනීමේදී පක්ෂග්‍රාහී බවක් පෙනීයන අතර එවැනි තෝරාගැනීමකදී සුදුසු නිර්ණායක තෝරාගෙන හැකිපමණ සියලු ප්‍රජා නියෝජිතයන් හා සම්බන්ධ වී අදහස් ලබාගෙන ගම්මාන තෝරාගතයුතු බව ප්‍රකාශ කරන ලදී.

- මෙයට පිළිතුරුදෙමින් ගරු ප්‍රධාන අමාත්‍ය තුමා දැනට තෝරාගෙන ඇති ගම්මානවල ව්‍යාපෘති දිගටම ක්‍රියාත්මකවන බවත් ඉදිරිකාලයේදී විවිධ ව්‍යාපෘති මගින් තවත් ගම්මාන සංවර්ධනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගනු ලබන බවත් ප්‍රකාශ කළේය.

- ලෝක බැංකුවේ මූල්‍යාධාරයෙන් ක්‍රියාත්මක වන පුරනැගුම (නෙල්සිප් Nelsip) ව්‍යාපෘතියේ අවසන්කර නැති යටිතලපහසුකම් සංවර්ධන වැඩසටහන් සම්පූර්ණ කළයුතු බවත් එයට අවශ්‍ය අතිරේක මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන මෙම ව්‍යාපෘතිය කරගෙනයායුතු බවත් ප්‍රකාශ කරන ලදී.

- කල්කුඩා, පුනානි යන ප්‍රදේශවල නැවතපදිංචිවූවන්ට ජීවනෝපාය හා නව ඉදිකිරීම් අවශ්‍යතා විශාල ප්‍රමාණයක් ඇති බැවින් අතිරේක මූල්‍ය ප්‍රතිපාදන ලබාදී ඔවුන්ගේ අවශ්‍යතා සම්පූර්ණ කළයුතු බව ඉල්ලා සිටින ලදී.

- පට්ටිරුප්පු මහිලමුනෙයි සිවශක්ත විද්‍යාලයේ පන්ති 07 ක් තාවකාලික මඩුවක පවත්වාගෙන යන බවත් පන්ති 04 ක් පමණක් ස්ථිර ගොඩනැගිල්ලක පවත්වාගෙන යන බවත් උපකරණ විශාල ප්‍රමාණයක් අවශ්‍ය බවත් ප්‍රකාශ කරන ලදී. සිවශක්ති විද්‍යාලයට උපකරණ තොගයක් යවා ඇති බවත් UNICEF මගින් රු. මි. 2 ක් වටිනා භාණ්ඩ යවා ඇති බවත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ප්‍රකාශ කළේය. අදාල පාසලට ගොස් දැනට පවතින තත්ත්වය නිරීක්ෂණය කර ඒ පිළිබඳ වාර්තාවක් තමා වෙත ඉදිරිපත් කරන ලෙස ගරු අධ්‍යාපන අමාත්‍ය තුමා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂහට ප්‍රකාශ කළේය.

- වෙබර් ක්‍රීඩාංගනය මධ්‍යම රජයේ ක්‍රීඩා අමාත්‍යංශය යටතට ගෙන සංවර්ධනය කෙරෙමින් පවතින අතර දැනට ශිෂ්‍යයන් 6000 කට පමණ ක්‍රීඩා පුහුණු වීමට ක්‍රීඩාංගනයක් නොමැති බවත් කඩිනමින් මහනගර සභාවට ආසන්න ඉඩම් කොටස තාවකාලිකව සකසා ශිෂ්‍යයන්ට ක්‍රීඩා කටයුතු සඳහා ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී. ඒ සමග වෙබර් ක්‍රීඩාංගනයේ සංවර්ධන කටයුතු අවසන් වූ පසු එය නැවත මහනගර සභාවට ලබාගතයුතු බවද ඉල්ලා සිටින ලදී. අදාල ඉඩම හැකි ඉක්මනින් සකසා තාවකාලික ක්‍රීඩාංගනයක් ලෙස ශිෂ්‍යයන්ට ලබාදෙන ලෙස මහනගර සභාවේ නගරාධිපතිවරයාට උපදෙස් දුන් ගරු ප්‍රධාන අමාත්‍යවරයා සංවර්ධන කටයුතු අවසන් වූ පසු වෙබර් ක්‍රීඩාංගනය මහනගර සභාව යටතට ගතයුතු බව ගරු ආණ්ඩුකාරතුමාගේ අවධානයට ලක්කරන ලෙස ආණ්ඩුකාර ලේකම්හට දැනුම්දුන්නේය.

- පිළිසකර කිරීම සඳහා මාර්ග තෝරාගැනීමේදී පළාත් සභා සභිකයක් සමග සාකච්ඡා කොට ඒවා තෝරාගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.

- මුල්ලුවෙට්ටුවාන් ඇළ ප්‍රතිසංස්කරණය පිළිබඳව මූලික ක්‍රියාමාර්ග ගෙන පසුව අත්හැරදමා ඇති බව ප්‍රකාශකරනලදී. එවිට මෙම වැඩසටහන ගොවිජන සේවා දෙපාර්තමේන්තුව යටතේ ගැනෙන බැවින් ඔවුන් සමග සාකච්ඡා කොට විසඳුමක් ලබාගතහැකි බවත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිළධාරීන් විසින් පෙන්වා දෙන ලදී. ඉදිරිකාලයේදී මෙවැනි කුඩා වැව් පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා එක්ව කෙසේ සංවර්ධනය කළයුතුදැයි ගොවිජන සේවා දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කොට වාර්තාවක් ලබාදෙන ලෙස වාරිමාර්ග විෂයභාර අමාත්‍යවරයා විසින් වාරිමාර්ග අධ්‍යක්ෂ වෙත උපදෙස් ලබාදෙන ලදී.

- මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේදී පළාත් පාලන ආයතනවලට අයත් මාර්ගවල විදුලි රැහැන් ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගලවා අදාල ස්ථානවලට සවිකළයුතු බවට ඉල්ලා සිටින ලදී. මෙවැනි මාර්ග සංවර්ධන කටයුතුවලදී ආරම්භයේදීම අදාල සියලු අංශ සමග සම්බන්ධ වී කටයුතු කළයුතු බවට උපදෙස් ලබාදෙන ලදී.

- මිරිදිය මසුන් ඇතිකිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සමහර දේශීය මත්ස්‍ය වර්ග වඳවීයන බවත් එය මගහරවා මත්ස්‍ය වගා කටයුතු සිදුකරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

- මඩකලපුව දිස්ත්‍රික්කය තුළම ගුණාත්මක බිත්තර වී නිෂ්පාදනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් එම බිත්තර වී භාවිතය නිරීක්ෂණය කළ යුතු බවත් ඉල්ලා සිටින ලදී.

- දේශගුණයට ඔරොත්තු නොදෙන එළදෙනුන් වෙනත් පළාත් වලින් ගෙන්වීම වෙනුවට පහසුවෙන් රැකබලාගත හැකි එළදෙනුන් වෙනත් පළාත් වලින් ගෙන්වීම මගින් සාර්ථක ප්‍රතිඵල ලබාගත හැකිය යන අදහස ඉදිරිපත් කරන ලදී. එසේම සතුන් සඳහාවන රක්ෂණය අඩු මුදලකට ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී.

- සිත්තාන්ඩි ප්‍රදේශයේ කුකුළුකෑම නිෂ්පාදන මධ්‍යස්ථානය හා හාල් මෝල අලුත්වැඩියා කරදෙන ලෙස ඉල්ලා සිටින ලද අතර කුකුළු කෑම නිෂ්පාදනාගාරය ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරඇති බව කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා පැවසීය.

- කරඩියනාරු කෘෂිකර්ම ගොවිපොළේ පුහුණු මධ්‍යස්ථානය පමණක් නැගෙනහිර පළාත් සභාව යටතේ පවතින අතර එහි සියලු අංශ නැගෙනහිර පළාත් සභාව යටතට ගැනීමට කටයුතු කරන ලෙස දන්වනු ලැබිණි.

- සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ලබාදෙනු ලබන මුදල් ලබාගැනීමට අයදුම්පත් විශාල සංඛ්‍යාවක් ලැබී ඇති බවත් එයින් සුළු ප්‍රමාණයකට පමණක් ගෙවීම් සිදුකරන බවත් යුද්ධයෙන් පීඩාවට පත්වූ ප්‍රදේශවල සත්‍යවශයෙන්ම පීඩාවටපත්වූවන්ට අදාල සහාය ලබාදීමට ක්‍රියාකළයුතු බවත් දන්වා සිටින ලදී. මෙයට පිළිතුරු දෙමින් ගරු සෞඛ්‍ය අමාත්‍යවරයා සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ විශේෂ ආඥාපනතක් සැකසෙමින් පවතින බවත් ඒවා සැකසීමෙන් පසු එම දීමනා ලබාදීමේ අඩුපාඩු විසඳෙන බවද දන්වා සිටින ලදී.

- ළමා අපයෝජන හා වැන්දඹුවන් පිළිබඳ ගැටළු දිගු කාලයක සිට වැඩිවෙමින් පවතින බවත් පළාත් සභා මන්ත්‍රීවරුන් මෙය විශාල සමාජ ගැටළුවක් ලෙස ගෙන ළමා අපයෝජන හා වැන්දඹුවන් පිළිබඳ ගැටළුවලට අවශ්‍ය නීතිමය කටයුතු පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතු බව දන්වා සිටින ලදී.

- සමුපකාර සමිති ස්වයං ආදායමක් උපයාගත නොහැකිව පසුබෑමට ලක්ව ඇති බවත් ඒවා විසඳීමට විශේෂ ක්‍රියාමාර්ග ගත යුතුබවත් අවධාරණය කරන ලදී.

- පෙර පාසැල් ගුරුවරුන්ගේ වැටුප් පිළිබඳව සාකච්ඡාකරමින් පෙරපාසල් ගුරුවරුන් 642 දෙනෙකුට කිසිදු දීමනාවක් නොදෙන බවත් අනෙකුත් අයට වෙනත් යම් යම් ආයතන මගින් දීමනා ලබාදෙන බවත් මේ සඳහා මූල්‍ය ප්‍රතිපාදන නොමැති බවත් ඔවුන්ට සුළු මුදලක් හෝ ලබාදීමට කටයුතු කළයුතු බවත් ඉල්ලා සිටින ලද අතර පෙර පාසල් ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා නව අදහස් ලබාගත යුතු බවත් දන්වා සිටින ලදී. මෙම ප්‍රශ්නය පිළිබඳව ගරු ප්‍රධාන අමාත්‍යතුමන් සමග සාකච්ඡා කොට අදාල ක්‍රියාමාර්ග ගන්නා බව ප්‍රකාශ කළ පෙර පාසල් කාර්යාංශ ප්‍රධානී ළදරු ඉගැන්වීම් උපදෙස් ක්‍රමවත් කිරීම හා නව ඉගැන්වීම් ක්‍රම ඉදිරියේදී ගෙනඒමට කටයුතු කෙරෙමින් පවතින බවද ප්‍රකාශ කරන ලදී.

- පාසැල් උත්සව වලට ප්‍රජා නියෝජිතයින් කැඳවීම පිළිබඳ චක්‍රලේඛයේ අපැහැදිලි බව විසඳා දෙන ලෙස ගරු අධ්‍යාපන අමාත්‍ය විසින් අධ්‍යාපන ලේකම් වෙත උපදෙස් දෙන ලදී.

5. **සංවර්ධන සැසියේ රැස්වීම අවසන් කිරීමේදී ප්‍රධාන ලේකම් විසින් පළාත් සංවර්ධන යාන්ත්‍රණය හා ක්‍රියාමාර්ග ඉහළනැංවීම පිළිබඳව පහත සඳහන් කරුණු ඉදිරිපත් කරන ලදී.**

- පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ඉහළ නිළධාරීන්ගේ සහභාගිත්වයෙන් ආංශයික රැස්වීම් පළාත් මට්ටමින් නියමිත පරතරයකින් පැවැත්වීම හා එම රැස්වීම් දිස්ත්‍රික් මට්ටමටද අදාල අංශ සහභාගිත්වයෙන් ව්‍යාප්ත කිරීම.

- සංවර්ධනය සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීමේදී සියලු අංශ සඳහා සම තත්ත්වයෙන් සලකා කටයුතු කරනු ලැබේ.

- මධ්‍යම රජයේ හා පළාත් ආයතනවල ක්‍රියාකාරකම්වල සහයෝගීතාවය උදෙසා අවශ්‍ය තොරතුරු හුවමාරු කර ගැනීම හා ගරු ආණ්ඩුකාර තුමා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා, ප්‍රධාන ලේකම්, පළාත් ලේකම්වරු, දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඇතුළු දිසාපතිවරු, ප්‍රාදේශීය ලේකම්වරු යන අයගේ සහභාගිත්වයෙන් සම්බන්ධීකරණ රැස්වීමක් ඉදිරියේදී පැවැත්වේ.

- ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම බලගන්වා, පළාත් සභා මන්ත්‍රීවරුන්, අදාල පළාත් සභා ආයතන නිළධාරීන්ගේ සහභාගිත්වයෙන් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක වන සියලු සංවර්ධන කටයුතු සාකච්ඡා කොට ක්‍රියාමාර්ග ගනු ලැබේ.

- දැනට පවතින යාන්ත්‍රණය හා පිළිවෙළ තවදුරටත් ඉදිරියට ගැනීමට නව අදහස් එකතු කිරීම.

මෙම රැස්වීමට පැමිණ උද්‍යෝගයෙන් යුතුව සහභාගිවූ සියලු ජනතා නියෝජිතයන්ට හා නිළධාරීන්ට ස්තූති කරමින් ප්‍රධාන ලේකම් විසින් මෙම වැඩසටහන නිමා කරන ලදී.

**ඩී.එම්.එස්. අබයගුණවර්දන,**
ප්‍රධාන ලේකම්,
නැගෙනහිර පළාත.